# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013

2016 අගෝස්තු - ඔක්තෝබර්

සමාජීය විද්‍යා පීඨය

ජනසන්නිවේදනය - **MACO - E 3025**

**නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. i නිර්මාණයක සහ වාර්තාවක පවතින වෙනස සාධක හතරක් (04) යටතේ විවරණය කරන්න.

(ලකුණු 2 X 4 = 08)

ii මානව චින්තනය සකස් කිරීමෙහිලා මෙන්ම මානව සබඳතා ගොඩනැංවීමෙහිලා නිර්මාණාත්මක සන්නිවේදනය යොදා ගත හැකි අයුරු සාධක හයක් (06) ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 X 6 = 12)

02. ''ජන විඥානය නිර්මාණශීලීත්වයේ පදනමයි'' රූපවාහිනී වෙළඳ දැන්වීම් නිර්මාණයෙහිලා ජන විඥානය උපයෝගී කරගෙන ඇති අයුරු නිදසුන් සහිතව පහදන්න.

(ලකුණු 20 )

03. පහත සඳහන් නිර්මාණ හා නිර්මාණකරුවන් කෙරෙහි අන්තර් සංස්කෘතික අධ්‍යයන ප්‍රවේශය බලපා ඇති ආකාරය කෙටියෙන් පහදන්න.

i. ජයන්ත චන්ද්‍රසිරි
ii. හෙන්රි ජයසේන
iii. මනමේ නාට්‍ය
iv. සුනිල් ආරියරත්න
v. මාර්ටින් වික්‍රමසිංහ
vi. සිංහබාහු නාට්‍ය
vii. ප්‍රේමසිරි කේමදාස
viii. රත්න ශ්‍රී විජේසිංහ
ix. ධර්මසේන හිමි ( දඹදෙණි යුගය )
x. මහගම සේකර

(ලකුණු 2 X 10 = 20)

04. වැත්තෑවේ හිමි, ධර්මසේන හිමි (දඹදෙණි යුගය), විද්‍යාචක්‍රවර්ති හා තොටගමුවේ ශ්‍රී රාහුල හිමි යන සාහිත්‍යකරුවන්ගේ භාෂා භාවිතයේ නිර්මාණශීලීත්වය උදාහරණ සහිතව පහදන්න.

(ලකුණු 20)

05. i මාධ්‍ය විශ්ලේෂණ ක්‍රම හතරක් (04) පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2 X 4 = 08)

ii එයින් එක් විශ්ලේෂණ ක්‍රමයක් උපයෝගී කරගනිමින් පහත සඳහන් ගී නිර්මාණයන්හි අන්තර්ගතය විශ්ලේෂණය කරන්න.

- සිරියහනේ ලණු ඉහිරී සුසුම් හෙලන රෑ
- දම්පාටින් ලා සඳ බැස යනවා
- දවසක් පැල නැති හේනේ
- පුන්සඳ රෑට ඇවිදින් හේනේ කළුව බිඳ

(ලකුණු 3 X 4 = 12)

06. i පහත සඳහන් සෞන්දර්ය නිර්මාණාංගයන්හි නිර්මාණශීලීත්වය කෙටියෙන් පහදන්න.

- ගීතය
- නාට්‍ය
- නර්තනය
- සංගීතය

(ලකුණු 2 X 4 = 08)

ii "චිත්‍රය නිර්මාණශීලී ප්‍රකාශන මාධ්‍යයකි" නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 12)

07. "ජනමාධ්‍ය සංදේශ පෝෂණයෙහිලා ජනශ්‍රැතිය මහෝපකාරී වේ." පුවත්පත් මාධ්‍යයේ අන්තර්ගතයට විශේෂිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත සඳහන් මාතෘකා අතරින් **හතරක් (04)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i නිර්මාණය හා භාෂාව
ii නිර්මාණය යනු කුමක් ද?
iii සන්නිවේදන පර්යේෂණ
iv විචාරකයාගේ භූමිකාව
v ගුවන් විදුලි මාධ්‍යයේ නිර්මාණශීලී ශක්‍යතා
vi තිර රචනය

(ලකුණු 5 X 4 = 20)